"ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධ ශාසනෙ"

# රාජ්‍ය සේවා බෞද්ධ සංගමය

## தமிழசு அரசு சேவைகள் புத்த சங்கம்

## Government Services Buddhist Association


ආරම්භය ශ්‍රී බු ව 2498 (1954 -10- 05) (සංස්ථාපිතයි)

115, විජේරාම මාවත, කොළඹ 07. www.gsba.lk


2019.06.22

ප්‍රධාන ලේකම්

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය සංවිධානය කරන**
**දඹදිව පුණ්‍යභූමි වන්දනා චාරිකාව - දඹදිව සැරිසර 2019**
**ඔක්තෝබර් මස 25 දින සිට නොවැම්බර් මස 08 දින දක්වා**

දාහතර ලක්ෂයක් පමණ වූ රාජ්‍ය සේවයෙහි නියුතු පිරිස් හා ඔවුන්ගේ දෙමාපියන් ඇතුළු පවුල්වල සාමාජිකයන් මෙන්ම විශ්‍රාමික රාජ්‍ය සේවක පිරිස් දඹදිව වන්දනා කරවන 2019 ඔක්තෝබර් මස 25 දින සිට නොවැම්බර් 08 දක්වා පැවැත්වෙන දඹදිව සැරිසර - දඹදිව පුණ්‍යභූමි වන්දනා චාරිකාව විශාල පිරිසකගේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවා බෞද්ධ සංගමය විසින් සංවිධානය කොට ඇත.

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරන අමාත්‍යංශයේ පුරවර සැරිසර වැඩසටහනේ සම්බන්ධිකරණ සහයෝගීත්වයද ලබාගනිමින් දියත් කෙරෙන මෙම චාරිකාවේදී ආරක්ෂාව සලසමින් බෞද්ධ විනය ආරක්ෂා වන අන්දමින්, විශේෂ දාන ශීල භාවනා හා පුද පූජා වැඩ සටහන් පැවැත්වීමටත් පුහුණු උපදේශක වරුන්ගේ සේවාව ලබාදීමටත්, මිල ගණන් සාපේක්ෂව සාධාරණව අයිකරීම් සැලසීමටත්, ගුණාත්මක බවින් යුත් ආගමික සංචාරයක් රාජ්‍ය සේවා නියුක්තික වූ පිරිසට ලබාදීමටත්, රාජ්‍ය සේවා බෞද්ධ සංගමය අරමුණු කොට ඇත.

එහෙයින් ඔබ පළාත් සභාවේ හා ඒ යටතේ පවත්නා සියලු ආයතනයන්හි සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන් හා සේවක පිරිස් මේ පිළිබඳව දැනුවත් කොට රාජ්‍ය සේවා බෞද්ධ සංගමය වෙත යොමුකරවන ලෙස කාරුණිකව ඉල්ලමි. තවද, මේ සම්බන්ධව සම්බන්ධීකරණ නියෝජිතයෙකු පත්කොට දැන්වීමද වැදගත් බවද අවධාරණය කරන අතර අදාල විස්තරද මේ සමඟ යොමුකොට තිබෙන බවද සඳහන් කරමි.

විමසීම්: දු:අංක **0117984477** ජංගම ඇමතුම්: **076 0554184 - 0701109577**

**www.serisara.lk** වෙබ් අඩවිය වෙත පිවිස dambadiva serisara වෙත යොමුවීමෙන්ද අදාල විස්තර ලබාගත හැක.

**එම්.කේ.බී. දිසානායක**
සභාපති
රාජ්‍ය සේවා බෞද්ධ සංගමය

# දඹදිව පුණ්‍ය භූමි වන්දනා චාරිකාව

## දඹදිව සැරිසර - දින 14 චාරිකාව

**අප මහා බෝසතාණන්ගේ පා පහස ලද ජන්ම භූමිය වන්දනා කර ගැනීමට අප විසින් සංවිධානය කරනු ලබන්නාවූ චාරිකාවක් සඳහා ඔබට කරනු ලබන ගෙ?රවනීය ආරාධනයයි...**

## ගමන තුළදී ඔබට දැක බලා වැඳ පුදා ගත හැකි පූජනීය ස්ථාන

### බරණැස



කාවේරි හා අස්ථ යන ගංගා අතරින් පිහිටි ප්‍රදේශයක වාරානසී නොහොත් බරණැස යන නමින් ව්‍යවහාර කෙරේ. ඉතිසිපතනය, මිගදාය, බුදු රඳුන් පළමු දම්සක් සුත්‍රය දේශනා කළ ස්ථානය, කොන්ඩඤ්ඤ හිමියන් නිවන් මග ලැබූ මිගදාය, සම්මුදු චෛත්‍යය, නව මූල ගන්ධ කුටි විහාරය, ධර්මපාල හිමිපාණන් වැඩ විසූ ආරාමය, මුවන් වෙසෙන මිගදා වනය, කටු ගෙය, සක්මන් මළුව, ආදී ස්ථාන රැසක් වැඳ පුදා ගැනීමට ද ධම්ම චක්ක පවත්වන සුත්‍ර දේශනාවට සවන් දීමට ද දාන ශීල භාවනා ආදි පින්කම් රැසක් සිදු කර ගැනීමට ද මෙහිදී අවස්ථාව සැලසේ.


### බුද්ධගයාව



බුදුන් වහන්සේලා පහල වන පුණ්‍ය භූමියක් වන බුද්ධගයාවේ දී ද කකුසඳ, කෝනාගමන, කාශ්‍යප බුදුවරයන් වහන්සේලා පහල වූ බව ධර්මයේ සඳහන් වේ. අප මහා බුදු පියාණන් බුද්ධත්වය ලැබුවේ ද මෙම පුණ්‍ය භූමියේ දීය. ලොව්තුරා සම්බුදුවරයන් වහන්සේලා සතර නමක් පහල වූ බුද්ධගයාව අදත් ජීවමාන බුදුරජාණන් වහන්සේ වැඩ සිටිනු වැනිය. මෙහිදී ඔබට සත්සතිය ගත කළ ස්ථාන, සේනානි ගම, සුජාතා මාලිගය, බුද්ධගයා විහාරය, ජය ශ්‍රී මහා බෝධිය, දුර්ගේෂ්වරිය (දුෂ්කර ක්‍රියා කළ ස්ථානය) දැක බලා වැඳ පුදා ගත හැකිය.

### රජගහ නුවර






ශාක්‍ය සංහාරයට ගිය විඩුඩන කුමාරයා ඇතුළු යුධ භටයන් සහිත ගැල් පන්සියය වේළුවන විහාරයේ වැඩ සිටි බුදු රජාණන් වහන්සේ ගල් තලාවන් මත එරී යාමට සැලැස් වූ අතර එම ස්ථානයද, විදුලි පුටු වල ආධාරයෙන් ඉහළට නැග දැක බලා ගත හැකි ජපන් සාම චෛත්‍යය සහ ගිජ්ජකූට පර්වතය, දෙව්දත් තෙරණුවන් බුදු රදුන් මතට ගල් පෙරලූ ස්ථානය, තපෝද්‍ය නදිය, පිප්පිලි ගුහාව, බිම්බිසාර රජතුමා සිර කර කර වූ මාලිගය, අජාසත් රජු විසින් කරවන ලද සාල සණ්ඨා චෛත්‍යය හා නාලන්දා විශ්ව විද්‍යාලය (මෝගල්වරුන් විසින් අපගේ දෙස් විදේස ස්වාමීන් වහන්සේලා 15000 ක් පමණ එකම ස්ථානයේ දී ඝාතනය කරනු ලැබූ) දැක බලා ගත හැකිය.

### විශාලා මහ නුවර



තුන්බිය පැමිණි අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ විසින් රතන සුත්‍රය දේශනා කොට වඩාලේ විසාලා මහ නුවර දින. බුදුරජාණන් වහන්සේගේ ආදාහනයෙන් පසු ලෙච්ජම් රජ දරුවන්ට ලැබුණු ධාතුන් වහන්සේ තැන්පත් කළ චෛත්‍යයකි. සාලාසාර කුටි අශෝක රජතුමා විසින් බෞද්ධ සිද්ධස්ථාන සිහි වීම පිණිස කර වූ සංඝ කුළුණ දැක බලා ගත හැකියි.

## කුසිනාරා නුවර



කුසිනාරා නුවර බුදුන් වහන්සේ ආදහන චෛත්‍ය පිරිනිවක් මංචකය පිහිටි භූමියයි. බුදුරජාණන 'වහන්සේ අවසන් වරට පැන් වැළඳූ කුක්කුටා නදිය, බුදු රඳුන්ගේ ශරීරය සඳුන් දරින් ආදාහනය කළ ස්ථානය, එහි අගුරු එකතු කර නිධන් ගත කිරීමට බැඳි අංගාර චෛත්‍ය දක ගත හැකිය. මල්ලව රජ දරුවන් ඔවුනු පලන් ස්නයේ අංගාර චෛත්‍යය ඉදි කළ හෙයින් එයට මකුට බන්ධබ චෛතිය ද කියනු ලැබේ. බුදුන් වහන්සේ දූඩි ගිලන් බව නිසා අතරමග මීක් වැඩ හිද පැන් වැළඳූ තැන ද දක ගත හැකය.

## ලුම්බිණිය



සිද්ධාර්ථ කුමාරයාගේ උත්පත්තිය සිදු වූ ස්ථානය සහ මහාමයා පෙදෙස රහතන් වහන්සේලාගේ ධාතු නිදන් කළ චෛත්‍යයන් ආදී ස්ථාන දකබලා ගත හැක.

## කපිල වස්තු



සිදුහත් කුමරු අවුරුදු 29 ක් ජීවත් වූ සුද්ධෝදන රාජධානීය, නිග්‍රෝධාරාමය, කපිල වස්තු චෛත්‍යය ආදි පැරණි සිද්ධස්ථාන රැසක් දකබලා ගත හැකිය.

## සැවැත් නුවර




සැවැත් නුවර ජේතවනාරාමය, ආනන්ද බෝධීන් වහන්සේලා අකේපිඩු සිටු මාලිගය, අංගුලිමාලට පිරිත් දේශනා කළ ස්ථානය, අචිරවතී නදිය, දෙව්දත් තෙර, චිංචිමානවිකාවන් ආදීන් අපායට ඇදගෙන ගිය තැන උයැයි සැලකෙන ස්ථානයන් දක බලාගත හැකි අතර ලංකාරාමයේ දී සාංඝික දාන මාන සහ ආනන්ද බෝධීන් වහන්සේට පවත්වන බෝධි පූජාවන් වලට සහභාගී විය හැක.

## සංකස්ස නුවර




බුදු රජාණන් වන්සේ සැවැත් නුවර ගන්ධබ්බ මූලයේදී තීර්ථක දමනය සඳහා ඇසළ පුන් පොහෝදා යමාමහ පෙලහර පා වදාළ සේක. ඉන්පසු එහිදීම අතුරුදන්ව තව්තිසා දෙව්ලොව ශක්‍ර භවනයට වැඩි සේක. ශක්‍ර දේවේන්ද්‍රයන්ගේ ආරාධනයෙන් පාණ්ඩුකම්බල ශෛලාසනය මත වැඩහිඳ පසු දින වස් සමාදම් වු සේක. මාතෘ දෙව්පුත් ඇතුළු දෙවියන්ට තෙමසක් බණ දෙසා මනුෂ්‍ය ලෝකයට වැඩිය. ස්ථානය සංකස්ස නුවරයි. ඒ අසල හමු වූ අශෝක කුළුණ කැබලි එකතු කොට ආවරණයක් සාදා ඇත.

## අග්‍රා



ක්‍රි.ව. 1648 දී සාජහන් මුස්ලිම් අධිරාජ්‍යයා විසින් ස්වකීය දේවිය වු මුම්ටාස් දේවිය සිහිවීම පිණිස යමුනා නදී තීරයේ කරවන ලද ටජ්මහල් මන්දිරය නිහ්මිත නිර්මාණයකි. මුස්ලිම් අධිරාජයකු විසින් කරවන ලද විශාල බලකොටුවන් වන රතු බලකොටුවද බලා ගත හැකිය. මෙහි ටජ්මහල් මන්දිරය ලොව පුදුම හතෙන් එකක් ලෙස සැලකේ.

## නව දිල්ලිය



ඉන්දියාවේ අගනුවර දිල්ලිය, අති දර්ශනීය විශාල නගරයකි. මහත්මා ගාන්ධිගේ නිවස හා ඔහුට වෙඩි තැබු ස්ථානය, නෂ්ටාවශේෂ තැන්පත් කල ස්ථානය සහ පරිහරණය කල කෞතුක වස්තුන්ද අපට නැරඹිය හැකිය ශ්‍රී නේරු රාජිව් ගාන්ධි ආදාහනය කල කැන් සහ නෂ්ටාවශේෂ තැන්පත් කල තැන්ද ඉන්දිරා මැතිණියගේ නිවස සහ වෙඩි තැබු ස්ථානයද දක බලා ගත හැක.

# දඹදිව පුණ්‍යභූමි වන්දනා චාරිකාව - දඹදිව සැරිසර
# 2019 වර්ෂය ඔක්තෝම්බර් 25 සිට නොවැම්බර් 08 දින දක්වා

## ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ

ලොව්තුරා බුදු කෙනෙකු සියැසින් දකින්නට පින් මදි වුණු ලොව්තුරා බුදු කෙනෙකු සියැසින් දන් පුදන්න පිං මදි වුණ මුත් බුද්ධෝත්පාද කාලයක දුර්ලභ මිනිස් භවේ ඉපිද ලොව්තුරා බුදු කෙනකුත් සියැසින් දැක සියැසින් දන් පුදන්නට සම්මා වායාමයෙන් සියලු බුදුවරයන්ගේ පහස ලත් බුද්ධ භූමියේ සැරිසරා පුරන වීර්ය පාරමිතාවයි.

### පළමු දිනය :-

- ★ සුදෝසුදු වතින් සැරසි බුද්ධාලම්භන ප්‍රීතිය හා ශ්‍රාද්ධා ගෞරව සිත් පෙරදැරිව මව් බිමෙන් සියලු බුදු වරයාණන් වහන්සේලාගේ දේශය බලා පිටත්ව යාම.

### දෙවන දිනය :-

- ★ සියලු සර්වඥයාණන් වහන්සේලා අත් නොහරින අවිජහිත පිං බිමත් වූ සංකස්සපුර පිං බිම දැක වැඳ පුදාගෙන සියලු දෙනට සෙත් පතා පඤ්චසතික අධිෂ්ඨාන ධූප පූජාව පැවැත්වීම.

### තෙවන දිනය :-

- ★ ලොව්තුරා බුදු රජුන් වන්සේලා බුද්ධ ජීවිතයේ වැඩිම කලක් වැඩ සිටියා වූ සැවැත් නුවර බලා පිටත්ව යාම.

### සිව්වන දිනය :-

- ★ සැවැත් නුවර දෙව්රම් වෙහෙර පිං බිමෙහි සියලු බුදු වරයාණන් වහන්සේලාගේ ගුණ සිහි කරමින් ශබ්ද පූජා පෙරදැරිව හිමිදිරි උදෑසන බීර පායාස පූජාව හා අෂ්ඨාංග උපෝසථ ශිල සමාදානය.
- ★ ලොව පහළ වූ සියලු බුදු වරයාණන් වහන්සේලාගේ ශ්‍රී පාදස්පර්ශය වැඩීම වරක් ලැබූ දෙව්රම් වෙහෙර වන්දනාව.
- ★ සවනක් ඝණ බුදුරැසින් නැහැවුණු ආනන්ද බෝ සමිඳුන් අභියස කප් රුක් පූජාව සහිත වූ අෂ්ඨපාන ගිලන්පස පූජාව සහ සත් බුදු වන්දනාව.
- ★ දහවල බුද්ධ ප්‍රමුඛ මහ සංඝ රත්නය උදෙසා පිරිනමන සංඝික දානමය පිංකම.
- ★ සර්වඥ ධාතුන් වහන්සේ සියැසින් දැක ගැනීම හා සධහතුක ධාතු කරඬුව හිස මත තබා සියලු දෙනාට ආශිර්වාද කිරීම.
  ධර්ම දේශණය
- ★ අනේපිඬු සිටු මාලිගයෙහි අංගුලිමාල ස්තූපය හා බුදුන් වහන්සේ අවසන් වරට යමහ මහ පෙළහැර පෑ ගණ්ඩබ්භ වෘක්ෂ මූල ස්තූපය වැක වැඳ පුදා ගැනීම හා සිල් පවාරණය

### පස්වන දිනය :-

- ★ සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය සිදු වූ ලුම්බිණි පිංබිම බලා පිටත් වීම.
- ★ සිද්ධාර්ථ මහ බෝසතුන් එකුන් තිස් වසරක් ගෙය විසූ කපිල වස්තු පුර දැක බලා ගැනීම.
- ★ අප මහ බෝසතාණන් මව් කුසින් නික්ම ඔහු ලොවට වැඩියාවූ ලුම්බිණි සාල උද්‍යානය දැක වැඳ පුදා ගැනීම.
- ★ ගෙත්තම් කරන ලද පුණ්ඩරික (නෙළුම් මල්) ආශිර්වාදාත්මක ධජ පූජාව.

### හයවන දිනය :-

- ★ කුසිනාරා නුවර බලා පිටත් වීම.
- ★ තිලොවම කම්පා කරමින් පුරා පන්සාලිස් වසක් දෙව් බඹු මිනිසුන්ට පතල මහා කරුණාවෙන් දහම් දෙසු ලොව්තුරු බුදු සමිඳුන් පිරිනිවීමට වැඩියා වූ මල්ල රජ දරුවන්ගේ උපවර්තන සාල උද්‍යානයේ පිහිටි මහා පරිනිර්වාණ ස්තූපය වන්දනා කිරීම හා සුගත චීවර පූජාව.
- ★ ගිලන්පස දානය හා පවස ඇත්තවුන්ගේ පවස නිවීම උදෙසා සිසිල් පැන් දන්සල.

**සත්වන දිනය :-**

- විශාලා මහ නුවර දැක වැඳ පුදගෙන බුද්ධගයා බලා පිටත්වීම.
- රතන සූත්‍රය දේශනාව සිදු කළ කූඨාගාර ශාලාව, අශෝක රජු කර වූ අශෝක කුළුණ අනතුරෙන් විනාශ නොවූ අශෝක කුළුණ, ලිච්ඡවි රජ දරුවන් අභිසෙස් කළ පොකුණ අම්ල පාලි ධාතු ස්තූපය, ලිච්ඡවීන් කර වූ සර්වඥ ධාතු ස්තූපය දැක වැඳ පුදා ගැනීම.
- සියලු දෙනාට සෙත් ප්‍රර්ථනා කර ප්‍රදීපයන් දල්වා රතන සූත්‍රය සජ්ඣායනා කිරීම.

**අටවන දිනය :-**

- ලොව පහළ වන සියලුම ලොව්තුරාණන් වහන්සේලා සංසාර කැණිමඩල සිඳ දමන උතුම් බුද්ධගයා පින්බිමේ බුද්ධාලම්බන ප්‍රීතියෙන් හා ශ්‍රාද්ධා ගෞරවයෙන් ශබ්ද පූජා පෙරදැරිව පවත්වනු ලබන බීර පායාස පූජාව හා අෂ්ඨාංග උපෝසර ශීල සමාදානය.
- පිණ්ඩපාත දානමය පිංකම
- සත්සති වන්දනාව
- බුද්ධ ප්‍රමුඛ මහ සංඝරත්නය උදෙසා දහවල සංඝික දානය පිරිනැමීම.
- අසිරිමත් සම්බුද්ධාගමන සඳහන් ධර්ම දේශනාව
- කප්රුක් සහිත චීවර පූජාව, පුෂ්පයන් අතුරා සිදු කරන පුෂ්ප පූජාව.
- ආලෝක පූජාව, කෙසැත්තෘ කොඩි පූජාව.

**නවවන දිනය :-**

- රජගහ නුවර බලා පිටත්වීම.
- නාලන්දා විශ්ව විද්‍යාලය, බිම්බිසාර රජුන් සිරගත කළ සිර මැඳුර, වේභාරපර්වතය සප්තපර්ණි ගල් ගුහාව, විඩුඩභ රජුගේ රථය එරුණු ස්ථානය. ජීවක වෛද්‍යවරයාගේ රෝහල් පරිශ්‍රයෙහි නටබුන්, ජපන් සාම චෛත්‍ය, දෙව්දත් තෙරුන් බුදුන් වහන්සේට ගල් පෙරලු ස්ථානය දැක බලාගෙන ගිජ්ජකූට පර්වතයෙහි බුදුන් වහන්සේ වැඩ සිටි සුගන්ධ කුටිය අභියස අටානාටිය සූත්‍ර දේශනාව.

**දහවන දිනය :-**

- බෝධිසත්වයන් වහන්සේ බුද්ධත්වය ලැබීම උදෙසා වීර්ය වැඩු ස්ථානය යැයි සැලකෙන ස්ථානය දැක බලා ගැනීම. (දුර්ගේෂ්වරි ගල් ගුහාව)
- බෝසතුන් වහන්සේට සුජාතා දියණිය කිරි ආහාර පූජා කළ ස්ථානය, සොත්ථිය බමුණු තෙම කුස තණ පූජා කළ ස්ථානය, තුන් බෑ ජටිලයන් හා නාගයා දමනය කළ ස්ථානය, නේරංජනා නදිය දැක ලබා ගැනීම.
- බරණැස ලබා පිටත් වීම.
- බුදු රජුන්ට පස්වග තාපසයන් මුණ ගැසුණු ස්ථානයෙහි පිහිටි සම්මුඛ චේතිය වන්දනා කිරීම.
- අනාගාරික ධර්මපාල තුමා විසින් කර වූ නව මුල ගන්ධකුටි විහාරයේ පැවතුම් සූත්‍ර දේශනාවට සහභාගී වීම.

**එකොළොස්වන දිනය :-**

- හිමිදිරි උදෑසන නව මුල ගන්ධකුටි විහාරයේදී ශබ්ද පූජා පෙරදැරිව බීර පායාස පූජාව හා සීල සමාදානය.
- ඉසිපතන මිගදාය වන්දනා කිරීම.
- ධර්ම රාජක සෑ රඳුන් උදෙසා සිදු කරන පුෂ්ප පූජාව.
- ධම්මික ස්තූප රාජයාණන් උදෙසා සිදු කරන කප් රුක් පූජාව.
- අටවිසි බුදු රජාණන් වහන්සේලා උදෙසා ගිලන් පස පූජාව හා ආලෝක පූජාව.

**දොළොස්වන දිනය :-**

- අග්‍රා බලා පිටත් වීම.
- ලොව සුපතල ටජ්මහල නැරඹීම.

**දහතුන්වන දිනය :-**

- දිල්ලිය බලා පිටත් වීම.
- දිල්ලි නගර සංචාරය සතිපට්ඨාන සූත්‍රය දේශනා කළ ස්ථානය දිල්ලි කෞතුකාගාරයේ තැම්පත් කර ඇති කපිලවස්තු සර්වඥ ධාතූන් වහන්සේලා වන්දනා කිරීම. සාප්පු සවාරි

**දහහතරවන දිනය :-**

- ලංකාව බලා පිටත් වීම.

# දඹදිව පුණ්‍ය භූමි වන්දනා චාරිකාව
# දඹදිව සැරිසර

## දඹදිව වන්දනා චාරිකා වන්දනාකරුවන් සඳහා පහත සඳහන් පහසුකම් සලසනු ලැබේ.

- සෑම වන්දනා කරුවකුටම රු. 400,00/=ක හදිසි අනතුරු රක්ෂණ ආවරණයක්
- සෑම වන්දනා කරුවකුටම රු. 300,00/=ක ස්වභාවිත මරණ රක්ෂණ ආවරණයක්.
- සංචාරයට අවශ්‍යය කි.ග්‍රෑ. 25ක පමණ බඩු ගෙන යා හැකි ගමන් බෑගයක් හා කි.ග්‍රෑ. 05ක පමණ බඩු ගෙය යා හැකි අත් බෑගයක් සියලු වන්දනා කරුවන් වෙත නොමිලේ ලබාදෙනු ලැබේ.
- චාරිකාවේදී සුඛෝපභොගී වායුසමනය කළ බස් රථ, යාබද නාන කාමර සහිත සුවපහසු නවාතැන් (Non A/C). ශ්‍රී ලංකික ආකාරයට ආහාර හා බීමට පිරිසිදු බෝතල් කල පානීය ජලය හෝ අවශ්‍යය නම් උණුසුම් ජලය ලබාදෙනු ලැබේ.
- චාරිකාවේදී විශේෂ පුහුණුව ලත් කාර්ය මණ්ඩලයකගේ සුහදශීලි සේවය.
- සිද්ධස්ථාන තුනකදී පෙහෙවස් සමාදන් කරවීම හා මහා සංඝික දානමය පිංකම් සිදු කිරීම.
- විශාල ප්‍රමාණයේ කණ්ඩායම් ඡායා රූපයක් සියලු වන්දනා කරුවන් වෙත නොමිලේ ලබාදෙනු ලැබේ.
- ඔබ සහභාගී වන චාරිකාවම ඇතුළත් DVD තැටියක් නොමිලේ ලබාදෙනු ලැබේ.
- ඉන්දියානු හා නේපාල වීසා ලබාදීම.
- ඉන්දියානු සිද්ධස්ථාන වලට ඇතුළුවීම සඳහා ප්‍රවේශපත්‍ර ගාස්තු ලබාදීම.
- මෙම සේවා පහසුකම් සහිතව දඹදිව වන්දනා චාරිකාව සඳහා එක් අයෙක් සඳහා අදාළ ගාස්තු රුපියල් 97500/= පමණි.

ගුවන් ගමන් බලපත්‍ර සෑදීමට හෝ වලංගු ගමන් බල පත්‍රයක් ඇතනම් අවශ්‍ය ලියකියවිලි

**ගුවන් ගමන් බලපත්‍රය සෑදීමට හා වීසා ලබාගැනීම සඳහා පහත ලියකියවිලි අවශ්‍යයවේ.**

★ උපැන්න සහතිකයේ මුල් පිටපත (නොමැතිනම් දරුවකුගේ උප්පැන්න සහතික මුල් පිටපතක් හා උප්පැන්න සෙවීමේ ලේඛනය.)

★ පුරවැසි හැඳුනුම්පත හෝ වැඩිහිටි හැඳුනුම් පත (නොමැති නම් ග්‍රාම සේවක මහතා සහතික කළ ඡායා රූපයක් හා සම්පූර්ණ විස්තර සහිත ග්‍රාම නිලධාරී සහතිකයක්)

★ ආගමන හා විගමන දෙපාර්තුමේන්තුව මගින් නිර්දේශිත ඡායා රූපාගාරයකින් ලබාගත් පාස්පෝට් ඡායාරූපය සහිත රිසිට් පත

★ විසා ලබා ගැනීම සඳහා අඟල් 2X2 සුදු පසුබිම සහිත වර්ණ ඡායාරූප 05 ක්

★ කලින් ලබාගත් කල් ඉකුත් වූ විදේශ ගමන් බලපත්‍රයක් තිබේ නම් එයද අප වෙත බාර දෙන්න.

**-වලංගු ගමන් බල පත්‍රයක් ඇත්නම් වීසා ලබා ගැනීම සඳහා පහත ලියකියවිලි අවශ්‍යයවේ.**

- වලංගු විදේශ ගමන් බලපත්‍රය.
- කලින් ලබාගත් කල් ඉකුත් වූ විදේශ ගමන් බලපත්‍රයක් තිබේනම් එයද අප වෙත භාර දෙන්න.
- වීසා ලබා ගැනීම සඳහා අඟල් 2X2 සුදු පසුබිම සහිත වර්ණ ඡායාරූප 05 ක්
- පුරවැසි හැඳුනුම්පත හෝ වැඩිහිටි හැඳුනුම් පත (නොමැති නම් ග්‍රාම සේවක මහතා සහතික කළ ඡායා රූපයක් හා සම්පූර්ණ විස්තර සහිත ග්‍රාම නිලධාරී සහතිකයක්)

**(ඔබ උපැස් යුවලක් භාවිතා කරන්නේ නම් සියලු ඡායාරූප උපැස් යුවල නොමැතිව ලබාගන්න.)**

☸ දඹදිව පුණ්‍ය භූමි වන්දනා චාරිකාව සඳහා ඔබත් ආදර්ශ අයදුම්පත පුරවා පහත ලිපිනයට රාජ්‍ය සේවා බෞද්ධ සංගමය වෙත යොමු කොට ලියාපදිංචි වන්න.

අයදුම් පත්‍රය පිරවීමට උපදෙස් හා වැඩි විස්තර සඳහා විමසන්න.


දඹදිව පුණ්‍ය භූමි වන්දනා චාරිකාව - දඹදිව සැරිසර

**රාජ්‍ය සේවා බෞද්ධ සංගමය**

අංක 15, විජේරාම මාවත, කොළඹ 07.

විමසීම් : දු: අංක : 011 79 844 77

ක්ෂණික ඇමතුම් : 0760 554 184 / 070 110 95 77


www. serisara. lk වෙත පිවිසීමෙන් ද වැඩි විස්තර ලබා ගත හැක.

# දඹදිව පුණ්‍යභූමි වන්දනා චාරිකාව - දඹදිව සැරිසර
# 2019 වර්ෂය ඔක්තෝම්බර් 25 සිට නොවැම්බර් 08 දින දක්වා
# අයදුම් පත්‍රය

කාර්යාල ප්‍රයෝජනය සඳහා :-

ගමන් බල පත්‍ර අයදුම්පත ☐ පාස්පෝට් ඡායාරූපය සහිත රිසිට් පත ☐ උප්පැන්න සහතික ☐

ජාතික හැඳුනුම්පත ☐ වීසා ඡායාරූප ☐ කල් ඉකුත් වූ ගමන් බල පත්‍රය ☐ වලංගු ගමන් බල පත්‍රය ☐

01. සම්පූර්ණ නම :- ..........................................................................
..........................................................................
02. උපන් දිනය :- ..........................................(දිනය / මාසය / වසර)
03. උපන් ස්ථානය :- ..........................................................................
04. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................
05. ස්ථිර ලිපිනය :- ..........................................................................
06. දුරකථන අංකය :- ..........................................................................
07. පදිංචි නගරය / ගම :- ..........................................................................
08. පදිංචි දිස්ත්‍රික්කය / පළාත :- ..........................................................................
09. දැනට නියුතු රැකියාව / විශ්‍රාමික නම් ඒ බව :- ..........................................................
රැකියා ස්ථානයේ ලිපිනය :- ..........................................................
10. අයදුම් කරු දරුවෙකු නම් ඉගෙන ගන්නා පාසල හා ලිපිනය :- ........................................
..........................................................................
11. අයදුම් කරුගේ පියාගේ (**ජීවතුන් අතර නැතත් විස්තර සටහන් කරන්න**)
නම .................................................. උපන් ප්‍රදේශය ......................
12. අයදුම් කරුගේ මවගේ (**ජීවතුන් අතර නැතත් විස්තර සටහන් කරන්න**)
නම .................................................. උපන් ප්‍රදේශය ......................
13. අයදුම් කරු විවාහක නම් බිරිඳ/සැමියා ගේ විස්තර (**ජීවතුන් අතර නැතත් විස්තර සඳහන් කරන්න.**)
නම .................................................. උපන් ප්‍රදේශය ......................
බිරිඳගේ/සැමියාගේ රැකියාව :- ..........................................................................
14. අයදුම් කරුගේ සෞඛ්‍යය තත්වය :- ..........................................................................
15. දිර්ඝ කාලීන ඖෂධ භාවිතා කරනවා ද :- ..........................................................
16. ඔව් නම් කුමන රෝගයක් සඳහා ද :- ..........................................................
17. හදිසි අවස්ථාවකදී දැනුම් දිය යුතු අයගේ නම/නෑදෑකම/දුරකථන අංක/ලිපිනය
..........................................................................

.................................................. ..................................................
අත්සන දිනය